**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.2.2 වගුවෙහි ඇතුළත් ආදායම් සංකේතයට අදාළ ආදායම් ගිණුම ද රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

### 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ආදායම් ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 රෙගුලාසිය ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125 (1) (අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති , රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරනු ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 2.1 ඡේදයේ සිට 2.18 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් එම විධිවිධානවලට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| - 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1 |
| | | 2. ප්‍රසම්පාදන ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.4.2 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.15 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ අඩුපාඩු | 2.9 |
| | | 2. විසඳා නොතිබුණු විගණන ඡේද | 2.8 |
| | | 3. අනුකූල නොවීම් | 2.16 |
| | | 4. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.17 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.2(ආ) |
| | | 2. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.2(ඇ) |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍යාංශයේ දී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.4.3 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.5(ආ) (i ,ii) |
| | | 2. කාර්යාල පවත්වා ගැනීමේ අඩුපාඩු | 2.5(ඇ) |
| | | 3. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවැතීම | 2.5(ඉ) |
| | | 4. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම් | 2.5(ඊ) |
| | | 5. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ දුර්වලතා | 2.10 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරීයා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේ දී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | 1. වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම | 2.6 |
| | | 2. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.14 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.11 (i), (iii) |
| | | 2. අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.11 (ii) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු | 2.12 |
| | | 2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.13 |

| | | | |
|---|---|---|---|
| 127(7) | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවල දී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවට ද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/ සේවකයන් මත අධිභාර පැනවීම ද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේ නම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීම ද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | 1. වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම<br>2. හානි පිළිබඳ වගකීම<br>3. මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.5(ඇ)<br>2.7<br>2.18 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

### සැලැසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 12 ක් පැවතිය ද ඒ සඳහා වන වාර්ෂික අක්මුදල් අවශ්‍යතා සැලැස්මක් (Imprest Requirement Plan) පිළියෙල කර නොතිබුණි.

## 2.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යභාරයන් 12ක් යටතේ කාර්යයන් 136 ක් ඉටුකළ යුතුව තිබුණත් , ඉන් කාර්යයන් 132 ක් පමණක් ඉටු කර තිබුණි. එසේ ඉටු නොකළ කාර්යයන් සඳහා එකතු රු.මිලියන 10.1 ක් ප්‍රතිපාදන සලසා තිබුණි.

(ආ) **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු ප්‍රධාන කාර්යයන් 06 කින් කාර්යයන් 04 ක් සඳහා රු. මිලියන 93.78 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) ඒකාබද්ධ සේවා අංශයේ සියළු සේවාවන්හි නිලධාරීන් 7,339 ක් බඳවා ගැනීමට හා නිලධාරීන් 5,663 ක් පුහුණු කිරීමට වෙන්කළ මුදලින් මිලියන 44 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණු අතර වියදම සම්බන්ධයෙන් ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.

(ii) මානව සම්පත් සංවර්ධන අංශයේ දිස්ත්‍රික්ක 25 ක කළමනාකරණ නොවන නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් සඳහා රු. මිලියන 4.9 ක වියදම් කර ඇතත් පුහුණු කළ යුතු නිලධාරීන් ප්‍රමාණය හා ප්‍රගතිය දක්වා නොතිබුණි.

(iii) තොරතුරු තාක්ෂණ අංශයේ ජාල පද්ධතිය අළුත්වැඩියා හා නඩත්තුව, මෘදුකාංග විසඳුම් සඳහා වූ රු.මිලියන 17 ක ප්‍රතිපාදනයේ මුළු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.

(iv) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 438 ක් ස්ථිර කිරීමට හා උසස් කිරීමට සැලසුම් කර තිබුණු අතර, ප්‍රගතිය සියයට 52 ක් පමණක් විය.

(v) ශ්‍රී ලංකා සැලසුම් සේවා අංශයේ නවක නිලධාරීන් 133 ක් බඳවා ගැනීමටත්, 168 ක් ස්ථානමාරු කිරීමටත් තත්ත්වපාලක කවය හා වගකීම ප්‍රවර්ධනය කිරීම සැලසුම් කර තිබුණ ද සැලසුම් කළ ප්‍රතිපාදනය හෝ උපයෝජනය කළ ප්‍රතිපාදනය පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

(ඇ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(i) මහනුවර නිල පියස ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී වෙන්කර තිබූ ප්‍රතිපාදනය රු. මිලියන 15 කින් රු. මිලියන 13.29 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවත් අපේක්ෂිත සියයට 16 ක් වූ භෞතික ප්‍රගතියෙන් ඉටුකර තිබුණේ සියයට 06 ක් පමණි.

(ii) පොළොන්නරුව නිල පියස ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ දී වෙන්කර තිබූ ප්‍රතිපාදනය රු.මිලියන 50 කින් රු.මිලියන 49.32 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවත් අපේක්ෂිත සියයට 18 ක් වූ භෞතික ප්‍රගතියෙන් ඉටුකර තිබුණේ සියයට 04 ක් පමණි.

## 2.3 තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්දිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 ප්‍රසම්පාදනය

-------------

### 2.4.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

-----------------------------------------------------------

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 47.714 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 46.262 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 1.452 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 3.043 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

### 2.4.2 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

----------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රාරම්භක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු අතර එම ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.4.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

----------------------------------------

මොණරාගල නිවාඩු නිකේතනය ඉදිකිරීම සඳහා රු. 29,944,552 ක් වැයකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2007 උපදේශකයන් තෝරාගැනීමේ හා සේවයේ යෙදවීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශයට අනුව උපදේශන සේවා සැපයීමේ ආයතනයක් තෝරා ගැනීමේදී තරඟකාරී පදනමකින් තොරව පෙර නිවාඩු නිකේතන ඉදිකිරීම සඳහා උපදේශන සේවා සැපයූ ආයතනයක් නැවත පත්කර ගෙන තිබුණි.

(ii) පළමුවර ඉංජිනේරු ඇස්තමේන්තුව වෙළඳපල මිල ගණන් පිළිබඳව සැලකිලිමත් වීම අඩු මට්ටමක පැවතීම හේතුවෙන් දෙවන වර ලංසු කැඳවීමට පුවත්පත් දැන්වීම් පලකිරීමට රු.70,068 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

(iii) දෙවනවර ලංසු කැඳවීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුව රු.3,012,415 කින් වැඩි කර සංශෝධනය කර තිබිය දී පළමුවර වැඩි මිලක් ඉදිරිපත් කර තිබූ ආයතනය දෙවනවර ලංසු කැඳවීමේ දී අඩු මිලක් ඉදිරිපත් කර කොන්ත්‍රාත්තුව ලබා ගෙන තිබිණි. දෙවනවර ලංසු කැඳවීමේ ආරාධනයෙහි "ඌව පළාතේ ලියාපදිංචි වී ඇති " කොන්ත්‍රාත්කරුවන් සඳහා සීමා කොන්දේසියක් ඇතුළත්ව තිබුණ ද ලැබී තිබූ ලංසු දෙකම එම කොන්දේසියෙන් සම්පූර්ණ කර නොතිබීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශයෙන් බැහැරවීමක් නිරීක්ෂණය විය.

**2.5** **වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ)** **වත්කම් ලේඛනගත කිරීම**

2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට තොරතුරු ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රයේ කළමනාකරණ ප්‍රතිසංස්කරණ හා මහජන සම්බන්ධතා අංශයේ නිවාඩු නිකේතන 08 ක් ස්ථානගත කර ඇති ඉඩම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)** **වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට පහත සඳහන් පරිදි වාහන 61 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 903,298 ක් ධාවනය කර තිබුණු අතර, ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.5,091,494 ක් ද, වාහන සේවා කිරීම සඳහා රු.5,550,832 ක්ද, වාහන අළුත්වැඩියා සඳහා රු.1,471,822 ක් හා වාහන රක්ෂණය කිරීම සඳහා රු.4,737,328 ක්ද වශයෙන් එකතුව රු.16,851,476 ක් වැය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු.18.65 ක් වැය කර තිබුණි.

| | වාහන වර්ගය | වාහන ගණන | වටිනාකම | රියදුරු වැටුප් හා දීමනා හැර අනෙකුත් වියදම් | ධාවනය කළ කිලෝමීටර් ගණන | ධාවනය කළ කිලෝ මීටරයක් සඳහා වියදම |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | | රු. |
| 1 | කාර් | 38 | 345,598,532 | 8,943,142 | 480,756 | 18.60 |
| 2 | වෑන් | 06 | 36,000,000 | 2,342,549 | 96,762 | 24.21 |
| 3 | කැබ් | 16 | 80,260,000 | 5,547,449 | 319,126 | 17.38 |
| 4 | මෝටර් බයිසිකල් | 01 | 25,000 | 18,336 | 6,624 | 2.77 |
| | | 61 | 461,883,532 | 16,851,476 | 903,268 | 18.65 |

(ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝ මීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු නමුත් සංචිතයේ වාහන 28 කින් සමාලෝචිත වර්ෂය අවසානයට වාහන 04 ක පමණක් ඉන්ධන දහනය වීම පරීක්ෂා කර තිබුණි.

**(ඇ) කාර්යාල පවත්වා ගැනීමේ වියදම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය සතු කාර්යාල ගොඩනැගිලි 09 ක් ඇති අතර, ඊට අමතරව වාර්ෂිකව රු.56,969,546 ක කුලියක් මත ලබාගත් ගොඩනැගිලි 02 ක් ද වශයෙන් ගොඩනැගිලි 11 ක් අමාත්‍යාංශයට ඇත.

(ii) වාර්ෂික පිරිසිදු කිරීමේ ගාස්තුව රු. 6,378,731 ක් වන අතර ආරක්ෂක සේවා ගාස්තුව රු. 4,078,700 ක් වේ. ඒ අනුව මුළු ගොඩනැගිලි වෙනුවෙන් වූ වියදම රු.67,426,977 ක් වූයෙන් ඒක පුද්ගල කාර්යාලය පවත්වා ගෙන යාමේ වියදම රු.52,390 ක් වී තිබුණි.

**(ඈ) වත්කම් වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම**

2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිවාස 90 ක් සඳහා හිඟ කුලී ආදායම් රු. 52,487,029 ක් වූ අතර 2017 වර්ෂයේ නිවාස 31 ක් සඳහා හිඟ කුලිය රු. 3,288,092 ක් විය.

**(ඉ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පොත් අලෙවි සැලක් ඉදිකිරීමට රු.1,340,429 ක් වැයකර තිබුණ ද වර්ෂ දෙකක කාලයක සිට එය පාවිච්චියට නොගෙන නිශ්ක්‍රීයව පැවති අතර කාල පරිච්ඡේදය හඳුනාගත නොහැකි වාහන 02 ක් අමාත්‍යාංශ පරිශ්‍රය තුළ ගාල්කර තිබුණි.

**(ඊ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් පිරිවැය රු. 5,000,000 ක් වූ මෝටර් වාහනයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට නීත්‍යානුකූලව පවරාදීමකින් තොරව මුදාහැර තිබුණි.

**2.6 බැදීම් හා බැරකම්**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයන් 13 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 255.3 ක ප්‍රතිපාදනය රු.මිලියන 15.8 කින් ඉක්මවා රු.මිලියන 271.1 ක බැදීම් ඇතිකරගෙන තිබුණි.

(ආ) අවශ්‍ය හෙළිදරව් කිරීම් නොකර සමාලෝචිත වර්ෂයේ බැරකම් වෙනුවෙන් 2018 වර්ෂයේ දී ගෙවීම් කල වටිනාකම රු. 2,808,983 ක් විය.

**2.7 හානි පිළිබඳ වගකීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 104(2) (ආ) ප්‍රකාරව අලාභහානි අප්‍රමාදව අයකර ගැනීමට අපොහොසත් වුවහොත් එම අලාභහානි අයකර නොගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල් ප්‍රමාණය අධිභාරයන් ලෙස අයකරගත යුතු බව දන්වා ඇත. නමුත් 2017 වර්ෂයේ

ජුනි මාසයේ හා දෙසැම්බර් මාසයේ සිදුව තිබුණු අනතුරු 2ක් සම්බන්ධයෙන් රක්ෂණාවරණය ලැබී අලුත්වැඩියාව නිමකර තිබුණේ 2018 වර්ෂයේ ජූලි හා අගෝස්තු මාසවල දී ය. ඒ දක්වා එම වාහන නිශ්ක්‍රීයව ගරාජයේ ගාල්කර තිබුණි. තවද, එයින් එක් වාහනයක ප්‍රාරම්භක පරීක්ෂණයේදී අලාභ හානි වටිනාකම හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ඇස්තමේන්තුගත අලුත්වැඩියා වටිනාකම ලෙස හඳුනාගෙන තිබූ රු.2,110,260 වෙනුවට රක්ෂණාවරණයෙන් ලද මුදල වන රු.1,411,690 මුදල් රෙගුලාසි 104 (4) පරීක්ෂණ වාර්තා අනුව අලාභය ලෙස හඳුනාගෙන තිබුණි. මේ හේතුවෙන් අලාභ හානි වටිනාකම සැලකිය යුතු අලාභයක් වූ නමුත් මේ සඳහා වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාළ වාහන අනතුරු 04 කින් වූ රු.1,150,121 ක පාඩුව සම්බන්ධ පරීක්ෂණ කටයුතු 2018 අගෝස්තු 31 දින වන විටත් අවසන්වී නොතිබුණි.

**2.8 විසඳා නොතිබුණු විගණන ඡේද**

-----------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | <u>වර්ෂය</u> | <u>ඡේද අංකය</u> | |
| **(i)** | 2016 | 06 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියට අදාළ තනතුරු 76 ක් අතුරින් තනතුරු 10 ක් සඳහා නිත්‍ය නිලධාරීන් පත්කර තිබුණු අතර තනතුරු ඉතිරි තනතුරු සඳහා වැඩ බලන නිලධාරීන් පත් කර තිබුණි . |
| **(ii)** | 2016 | 3.4(අ)( i) | 2000 නොවැම්බර් 02 දිනැති අංක අමප/00/1848/23/019 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විදේශ සේවයේ නිලධාරීන්ට ඉදිකරන ලද නිවාස 20 ක ඉදිකිරීම් කටයුතු 2006 වර්ෂයේ දී අවසන්ව තිබුණි. ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසුව ද ශ්‍රී ලංකා විදේශ සේවයේ නිරත නිලධාරීන් වෙත වෙන් කර දී ඇති අමාත්‍යාංශය සතු නිවාස 07 පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(iii)** | 2016 | 3.4(අ)( ii) | බොරැල්ල කොටා පාරේ පිහිටි අමාත්‍යාංශයට අයිති නිවාසයක ආගමික මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන නමුත් අමාත්‍යාංශයට පවරා ගැනීමෙන් තොරව ඒ වෙනුවෙන් 2009 වර්ෂයේ සිට වරිපනම් බදු ගෙවා තිබූ බව නිරීක්ෂණය වූ අතර 2011-2017 කාලසීමාව සඳහා රු.34,548 ක් ගෙවා තිබුණි. |

**2.9** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

නියැදි විගණන පරීක්ෂණවල දී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ)** 2018 මාර්තු මාසයේ ක්‍රියාත්මක වූ ගණකාධිකාරී සේවයේ ස්ථාන මාරු නාම ලේඛන අනුව ස්ථාන මාරු ලැබූ නිලධාරීන් 47 ක් සේවය භාරගත් බවට දැනුම් දී නොතිබුණි. එසේ හෙයින් එම ස්ථාන මාරු ක්‍රියාත්මක වී ඇත්ද නැද්ද යන්න තහවුරු නොවුනු අතර අමාත්‍යාංශය විසින් ද ඒ පිළිබඳව පසු විපරම් කර නොතිබුණි. තවද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතීන්හි 217 ඡේදය පරිදි වාර්ෂික ස්ථාන මාරු නියෝගය අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ආ)** විමර්ශන අංශය වෙත 2017 වර්ෂය තුළ දී කොතරම් පැමිණිලි ප්‍රමාණයක් ලැබුණේද, ඉන් විමර්ශනය අවසන් කරන ලද පැමිණිලි ප්‍රමාණය , තාවකාලිකව අත්හිට වූ පැමිණිලි ප්‍රමාණය සම්බන්ධයෙන් සකස් කරන ලද තොරතුරු වාර්තාවක් පවත්වා නොතිබුණු අතර විමර්ශන කටයුතු භාර දීමේ ලේඛනය ද යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද ලේඛනගත තොරතුරු අනුව 2017 වර්ෂයේ දී විමර්ශන නිලධාරීන් 14 දෙනෙකු වෙත පවරන ලද පැමිණිලි 46 ක් 2017 අගෝස්තු 31 දින වන විටත් විමර්ශනය කර නොතිබුණි.

**2.10** **මහජනයා වෙත සේවා ඉටු කිරිම**

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියෙකු පත් කර තිබුණු අතර 2017 වර්ෂය තුල දී මහජනයා විසින් තොරතුරු ඉල්ලීම් 315 ක් ඉදිරිපත් කර තිබුණි. ඉන් ඉල්ලීම් 250 ක් සඳහා ඍජුව පිළිතුරු ලබා දී තිබුණු අතර, තවත් ඉල්ලීම් 26 ක් හා 02 ක් වශයෙන් පිළිවෙලින් අභියාචනා නිලධාරී වෙත හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ බවක් සඳහන් කර තිබුණි. ඉතිරි ඉල්ලීම් 37 ක් ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කර තිබුණි.

**2.11** **කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 593.65 | 573.60 | 20.04 | 3.38 |
| | මූලධන | 537.98 | 303.79 | 234.19 | 43.53 |
| | **එකතුව** | **1,131.63** | **877.39** | **254.23** | **22.47** |
| 2014 | පුනරාවර්තන | 703.77 | 672.53 | 31.23 | 4.44 |
| | මූලධන | 455.81 | 407.80 | 48.0 | 10.53 |
| | **එකතුව** | **1,159.58** | **1,080.33** | **79.23** | **6.83** |
| 2015 | පුනරාවර්තන | 1,092.31 | 1,048.86 | 43.43 | 4.0 |
| | මූලධන | 980.64 | 838.31 | 142.33 | 14.5 |
| | **එකතුව** | **2,072.95** | **1,887.17** | **185.77** | **8.96** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 1,041.57 | 1,027.95 | 13.63 | 1.31 |
| | මූලධන | 479.19 | 441.75 | 37.43 | 7.81 |
| | **එකතුව** | **1,520.76** | **1,46970** | **51.06** | **3.36** |
| 2017 | පුනරාවර්තන | 1,082.00 | 1,039.71 | 42.32 | 3.91 |
| | මූලධන | 738.44 | 532.25 | 206.15 | 29.92 |
| | **එකතුව** | **1,820.44** | **1,571.96** | **248.47** | **13.65** |

**විසර්ජන ගිණුම**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.300,000 ක සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ii) වැය විෂයයන් 12 ක් සඳහා එකතුව රු.මිලියන 520.56 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 308.78 පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක සිට සියයට 89 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(iii) පරිපූරක ඇස්තමේන්තු මඟින් අතිරේක ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කර තිබූ වැය විෂයන් 02 කට ලබාගත් පරිපූරක ප්‍රතිපාදනවලින් සියයට 45 ක් සහ සියයට 100 ක් ඉතිරි වී තිබුණි. නවක ගණකාධිකාරිවරුන් බඳවා නොගැනීමත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හා අග්‍රාමාත්‍ය කාර්යාලය එක්ව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමත් ඉතිරියට හේතු වූ බව ලේකම් විසින් අදහස් දැක්වීම් කර තිබුණි.

**2.12 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**----------------------------------------**

අමාත්‍යාංශය විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 20.02.01.01 ක් සඳහා රු.මිලියන 800 ක මූලික ආදායම් ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු අතර, එය රු.මිලියන 900 දක්වා වැඩිකරන ලෙස රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීම ඉටු වී නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.මිලියන 912.6 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 114 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2017 දෙසැම්බර් 31 දිනට** | | | **රැස්කළ ආදායම ඇස්තමේන්තු කළ අදායම ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම/ (ඌනතාවය)** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.02.01.01 | 800 | 912.6 | 112.6 | 114 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** පසුගිය වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ ගොඩනැගිලි කුලී තථ්‍ය ආදායම රු.122,782,924 කින් වර්ධනය වී තිබුණ ද ආයතන 36 කට අදාළ රු.56,224,432 ක

ආදායමේ අඩුවීමක් නිරීක්ෂණය වූ අතර එම අඩුවීම් ප්‍රමාණය සියයට 0.1 ක සිට සියයට 94 ක් දක්වා අතර පරාසයක් විය.

**(ආ) හිඟහිටි ආදායම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි මුළු ආදායම රු.188,087,784 ක් විය. ඉන් 2014 දෙසැම්බර් 31 දිනට පෙර සිට පැවති ශේෂය රු. 118,277,937 ක් වීමෙන් එය මුළු හිඟහිටි ආදායමෙන් සියයට 63 ක් වැනි ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ii) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ හිඟ කුලී ආදායම සමාලෝචිත වර්ෂය අවසානයට රු.57,478,597 විය. එයින් රු.44,140,514 ක් 2012 වර්ෂයට පෙර සිට හිඟ පවතින කුලී ආදායම් වන අතර ඒ තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අයවිය යුතු රු.36,042,000 ක ගොඩනැගිලි කුලියක් ද විය. එහෙත් එම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.7,474,535 ක් වුයෙන් එම වටිනාකම් දෙක අතර අසාමාන්‍ය වෙනසක් ද නිරීක්ෂණය විය.

## 2.13 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 13001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 64 | 54.303 | 26 | 28.768 | 191 | 130.6 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර අය වීම් හිඟහිටි ශේෂවල එකතුව රු.1,308,130 ක් විය. එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට 5 ට වැඩි කාල පරාසයක් දක්වා විහිද පැවතුණි. එහෙත් එම ණය ශේෂ අයකර ගැනිමේ පසු විපරම් කටයුතු ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂය අවසානය වන විට සේවය හැරගිය නිලධාරීන් 06 දෙනෙකුගේ රු.584,153 ක් වූ ණය ශේෂ අයකර ගත යුතුව තිබුණි.

## 2.14 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ පොදු තැන්පත් ගිණුම් 5 ක 2017 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂවල එකතුව රු. මිලියන 17.37ක් වුව ද, 2018 අගෝස්තු 31 දින වන විට එම ශේෂය රු. මිලියන 15.08 ක් විය.

## 2.15 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| (අ) ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) |
| (ආ) විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) |
| (ඇ) පොදු 267 ප්‍රකාරව ලොග් සටහන් (කළමනාකරණ ප්‍රතිසංස්කරණ හා මහජන සම්බන්ධතා අංශය) | මුදල් රෙගුලාසි 1645 (අ) |

## 2.16 අනුකූල නොවීම්

### 2.16.1 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 151 (2) හා 151(3) වගන්ති | | අපරික්ෂාකාරීව හා අධික වේගයෙන් ධාවනය කිරීම හේතුවෙන් 2016 හා 2017 වර්ෂවල දී අමාත්‍යාංශයට අයත් වාහන අවස්ථා 06 ක් අනතුරට ලක්ව තිබුණු අතර, ඉන් අමාත්‍යාංශයට රු.4,184,149 ක අලාභයක් සිදුව තිබුණි. |

| | | |
|---|---|---|
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**<br>--------------------------------------------- | |
| | (i) XIX පරිච්ඡේදයේ 6.1 සහ 7.2 වගන්ති | යම් තනතුරකට වෙන් කල නිවසක් හැර අනෙකුත් සියලුම නිවාසවල බදු කාලය වර්ෂ 5ක් විය යුතු අතර බදු කාලය ඉක්මවා නිවාසයක පදිංචිව සිටීනම් ඔහු එම නිවාසයෙන් ඉවත් කළ යුතු වුවත් නිවාස 16 ක පදිංචිකරුවන් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>--------------------------------------------- | |
| | (i) මුදල් රෙගුලාසි 1646 | වාහන භාර නිළධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වන දින ගත වන්නට ප්‍රථමයෙන්, 268 (අ) සාරාංශයෙහි මුල් පිටපතද සමඟ, ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන්, විගණකාධිපති වෙත යැවිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 1642 , 104 | අනතුරට භාජනය වී තිබුණු මෝටර් රථ දෙකක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පොලීසියට පැමිණිලි කිරීමට හා පරීක්ෂණයක් පවත්වා වගකිවයුත්තන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ඈ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>----------------------------- | |
| | 1999 ඔක්තෝම්බර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශයේ නිලධාරියෙකු වෙනත් අරමුදලක වැඩ බලන නිලධාරියෙකුට එම තනතුරට අදාළව වාහන දීමනාව ලෙස මාසිකව රු.30,000 ක් බැගින් රු.540,000 ක් හා ඉන්ධන දීමනාව රු.328,510 ක් ලබාගෙන තිබුණු අතර, මෙම කාලය සඳහා නිත්‍ය තනතුරට අදාළව නිල වාහනයක් හා ඉන්ධන දීමනාව අමාත්‍යාංශයෙන් ලබාගෙන තිබුණි. |

## 2.17 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

### 2.17.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

---------------------------------------------------------------------------------------------

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳව අමාත්‍යාංශය විගණනයට ඉදිරිපත් කළ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 695.48 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 68 | 17 |
| (ii) | තෘතියික මට්ටම | 21 | 14 | 07 |
| (iii) | ද්විතියික මට්ටම | 1,326 | 1,013 | 313 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 232 | 191 | 41 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | 01 | 01 | - |
| | එකතුව | 1,665 | 1,287 | 378 |

**(අ)** සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව අනුමත කාර්යය මණ්ඩලය දක්වා නොතිබුණු අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 1,369 ක් විය. නමුත් විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව අනුමත කාර්යය මණ්ඩලය 1,665 ක් ද තථ්‍ය කාර්යය මණ්ඩලය 1,287 ක් ද වූයෙන් තථ්‍ය කාර්යය මණ්ඩලයේ 82ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ආ)** සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව හා කාර්යසාධන වාර්තාවේ දක්වා තිබූ සංඛ්‍යා එකිනෙකට පරස්පර වීම හේතුවෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාවේ නිවැරදිතාවය තහවුරු නොවුණි.

**(ඇ) කාර්ය මණ්ඩලය පුහුණු කිරිම**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් එහි කාර්ය මණ්ඩලය පුහුණු කිරීම පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු පවත්වාගෙන නොතිබුණු බැවින් නිශ්චිතවම පුහුණුව ලද සංඛ්‍යාව හෝ කිසිම ආකාරයේ පුහුණුවක් ලබා නොතිබුණු නිලධාරීන් ගණන අනාවරණය කර ගත නොහැකි විය.

(ii)පසුගිය වර්ෂ 5 තුළ පුහුණු කිරීම් කටයුතු සඳහා සලසා තිබුණු රු.මිලියන 516.6 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 457.1ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂ 05 ක කාලය තුළ නිලධාරී පුහුණු කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනයක් කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

**2.18 රජයේ නිලධාරීන් ඇප තැබීම**

**-------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, හා පරිපාලනමය වශයෙන් වගකිව යුතු හා රජයේ ගිණුමට අදාළව වගකීම් පැවරී ඇති නිලධාරීන් ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබීම කර නොතිබුණි.